**ශ්‍රී ලංකා හොකී සම්මේලනය - 2024**

-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා හොකී සම්මේලනයේ ("සම්මේලනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ආදායම් සහ වියදම් ප්‍රකාශනය ,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වන වගන්තිය මඟින් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21.අ වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය මගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සම්මේලනය කටයුතු කර ඇති බව,

- සම්මේලනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | සම්මේලනය එහි අතිරික්තය මත ආදායම් බදු ගණනය කර දේශීය ආදායම් කොමසාරිස් වෙතට ප්‍රේෂණය කළයුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. | ආදායම් බදු ගෙවීම සඳහා එවැනි බැඳීමක් නැත. | පනතේ ප්‍රතිපාදන අනුව ආදායම් බදු ගෙවිය යුතුය. |
| (ආ) | 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද 2024 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග III කොටසේ 6(ix) වගන්තිය | ක්‍රීඩකයන්ගේ ඉහළ නිපුණතා සහිත මලල ක්‍රීඩකයන් හඳුනා ගැනීමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2024 වර්ෂය සඳහා දත්ත පද්ධතියක් සකසාගෙන යමින් පවතී. | ක්‍රීඩා නියෝග පිළිපැදිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,406,407 ක අතිරික්තයක්වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.753,687 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,160,094 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කෘතිම ක්‍රීඩා පිටියේ ආදායම රු.2,521,277 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| Sports Fiesta 2024 ක්‍රීඩා උත්සවයට සමගාමීව පැවැත්වෙන හොකී ක්‍රීඩා තරඟාවලිය වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්මේලනයට රු.3,500,000 ක මුදලක් ලබාදී තිබුණු අතර ඉන් රු.1,527,451 ක් තරඟාවලිය සංවිධානය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා වැය වී තිබුණි. එහෙත්, තරඟාවලිය සැලසුම් කළ පරිදි පවත්වා නොතිබීම හේතුවෙන් සංවිධාන ක්‍රියාකාරකම් සඳහා දරන ලද එම වියදම අනාර්ථික වියදමක් වී ඇත. | අධික වර්ෂාව හේතුවෙන් හොකී තරඟාවලිය අවලංගු කිරීමට සිදුවිය. | සැලසුම් කල පරිදි සියලු තරඟාවලි සම්මේලනය විසින් පැවැත්විය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩාව සංවර්ධනය කිරීමට සහය දැක්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ආසියානු හොකී සම්මේලනය (AHF) විසින් ඇමෙරිකානු ඩොලර් 972 ක වටිනාකමක් ඇති හොකී ක්‍රීඩා උපකරණ ප්‍රදානය කර තිබුණි. එහෙත්, මෙම වාර්තාවේ දින වන විටත් මෙම ක්‍රීඩා උපකරණ පළාත්/දිස්ත්‍රික් පාසල් වෙත බෙදාදී නොතිබුණි. | මෙම ක්‍රීඩා උපකරණ පාසල් දෙකකට බෙදාදී ඇති අතර ඉදිරියේදී හොකී ක්‍රීඩාව වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ක්‍රීඩා උපකරණ ග්‍රාමීය පාසල් වෙත බෙදා දීමට යෝජනාවී ඇත. | නොපමාව මෙම ක්‍රීඩා උපකරණ බෙදා දීම සිදු කළ යුතුය. |
| (ආ ) | 2024 වර්ෂයට අදාළ ජාතික ක්‍රීඩා දිනදර්ශනය අනුව ජාත්‍යන්තර තරඟාවලි 07ක් සහ දේශීය ක්‍රීඩා තරඟාවලි 06ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී දේශීය ක්‍රීඩා තරඟාවලි 04ක් සහ ජාත්‍යන්තර තරඟාවලි 05ක් පවත්වා නොතිබුණි. | කෘතිම ක්‍රීඩා පිටියක් නොමැතිවීම හා අධික වර්ෂාව හේතුවෙන් සැලසුම් කරන ලද තරඟාවලි පැවැත්වීමට නොහැකි විය. | සැලසුම් කළ පරිදි ක්‍රීඩා කටයුතු පැවැත්විය යුතුය. |